සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 10 | විෂයය Subiect | පුරවැසි අධ්‍යාපනය | කාලය Time | පැය 03 |

## I කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. ජනතාව විසින් ඔවුන්ගේ පාලනය සඳහා පවත්වාගෙන යන පාලන ක්‍රමය හඳුන්වනු ලබන්නේ,
(1). රදල පාලනය නමිනි. (2). ඒකාධිපති පාලනය නමිනි.
(3). රාජාණ්ඩු පාලනය නමිනි. (4). ප්‍රජාතන්ත්‍රවාදී පාලනය නමිනි.

02. ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලනයට සම්බන්ධවීමට අවස්ථාව හිමි වූයේ,
(1). පුරවැසියන්ට ය. (2). නගරවැසි කාන්තාවන්ට ය.
(3). විදේශිකයන්ට ය. (4). වහලුන්ට ය.

03. 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවති සමාජ ක්‍රමය හඳුන්වනු ලැබුවේ,
(1). ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමය ලෙස යි. (2). රදල සමාජ ක්‍රමය ලෙස යි.
(3). වැඩවසම් සමාජ ක්‍රමය ලෙස යි. (4). ධනවාදී සමාජ ක්‍රමය ලෙස යි.

04. ක්‍රි.ව. 1688 දී උත්කෘෂ්ට විප්ලවය සිදුවූයේ,
(1). බ්‍රිතාන්‍යයේ ය. (2). ප්‍රංශයේ ය.
(3). ඇමරිකා එක්සත් ජනපදයේ ය. (4). ඉතාලියේ ය.

05. මහජනයා වෙනුවෙන් තෝරාගන්නා නියෝජිතයන් මගින් රටේ පාලනය ක්‍රියාත්මක කිරීම,
(1). ප්‍රජාතන්ත්‍රවාදය යි. (2). ඍජු ප්‍රජාතන්ත්‍රවාදය යි.
(3). වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යි. (4). සමූහාණ්ඩු පාලන ක්‍රමය යි.

06. ඒක පක්ෂ ක්‍රමය පවත්නා රටවල් සහිත පිළිතුර තෝරන්න.
(1). ශ්‍රී ලංකාව, ඉන්දියාව, මහා බ්‍රිතාන්‍යය (2). ශ්‍රී ලංකාව, ඉන්දියාව, කියුබාව
(3). චීනය, කියුබාව, උතුරු කොරියාව (4). කියුබාව, උතුරු කොරියාව, ඉන්දියාව

07. තම දේශපාලන, ආර්ථික හා සමාජීය අවශ්‍යතා ඉටුකර ගැනීමට පුද්ගලයාගෙන් සමාජයට ලැබෙන ඉඩකඩ,
(1). සමානාත්මතාවය ලෙස හඳුන්වයි. (2). නිදහස ලෙස හඳුන්වයි.
(3). අයිතිවාසිකම් ලෙස හඳුන්වයි. (4). මූලික අයිතිවාසිකම් ලෙස හඳුන්වයි.

08. රටක මූලික නීතිය ලෙස හඳුන්වන්නේ,
(1). මානව අයිතිවාසිකම් ය. (2). රෝම ලන්දේසි නීතිය ය.
(3). ප්‍රජාතන්ත්‍රවාදය ය. (4). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ය.

09. කිසිදු අභ්‍යන්තර හෝ බාහිර බලවේගයක මැදිහත්වීමෙන් තොරව ජනතාව වෙනුවෙන් යෙදවිය හැකි බලය,

(1). ඒකාධිපති බලය නම් වේ. (2). සමාජ බලය නම් වේ.

(3). බලය නම් වේ. (4). ස්වාධිපති බලය නම් වේ.

10. යුරෝපයේ බිහිවූ පළමු ජාතික රාජ්‍යයන් වන්නේ,

(1). එංගලන්තය හා පෘතුගාලය යි. (2). එංගලන්තය හා ප්‍රංශය යි.

(3). ප්‍රංශය හා ස්පාඤ්ඤය යි. (4). එංගලන්තය හා ස්පාඤ්ඤය යි.

11. ආණ්ඩුවේ ප්‍රධාන ආයතනයන් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1). ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය

(2). ව්‍යවස්ථාදායකය, විධායකය, පාලනය

(3). ව්‍යවස්ථාදායකය, අධිකරණය, ප්‍රජාතන්ත්‍රවාදය

(4). ව්‍යවස්ථාදායකය, ප්‍රජාතන්ත්‍රවාදය, විධායකය

12. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාර්ථකත්වයට හේතුවන මැතිවරණයකදී මහජනයාට හිතකර ආණ්ඩුවක් බලයට පත් කර ගැනීම සඳහා වැදගත් කාර්යභාරය පැවරෙන්නේ,

(1). ඡන්දදායකයාට ය. (2). ඡන්ද අපේක්ෂකයන්ට ය.

(3). ජනාධිපතිට ය. (4). මැතිවරණ කොමිසමට ය.

13. සාමකාමී ජන සමාජයක් ගොඩනැගීමට හේතු නොවන්නේ,

(1). අධිකරණයේ ස්වාධීනත්වය (2). සුළුතර අදහස්වලට ගරු නොකිරීම.

(3). නීතියේ ආධිපත්‍යය පැවතීම. (4). සාකච්ඡා මගින් තීරණවලට එළඹීම.

14. පරමාධිපත්‍ය බලයේ අවසාන හිමිකරුවා වන්නේ,

(1). ජනාධිපතිවරයා ය. (2). අගමැතිවරයා ය.

(3). කැබිනට් මණ්ඩලය ය. (4). ජනතාව ය.

15. ''සෑම ආකාරයකම අධිකාරි බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශී වී තිබේ නම් එය ඒකීය රාජ්‍ය ක්‍රමයකි.'' යන නිර්වචනය ඉදිරිපත් කළ දේශපාලන විද්වතා වන්නේ,

(1). ඒබ්‍රහම් ලින්කන් ය. (2). මහාචාර්ය හර්මන් පේ ෆයිනර් ය.

(3). ඇරිස්ටෝටල් ය. (4). මහාචාර්ය ගානර් ය.

16. A ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
B උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පැවතීම.

ඉහත ලක්ෂණ ඇතුළත් වන්නේ,

(1). නූතන රාජ්‍යවල ය. (2). සන්ධීය රාජ්‍යවල ය.

(3). ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල ය. (4). රාජ්‍යවල ය.

17. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරන ලද්දේ,

(1). 1947 ජනවාරි 10 වන දිනය. (2). 1947 දෙසැම්බර් 10 වන දිනය.

(3). 1948 ජනවාරි 10 වන දිනය. (4). 1948 දෙසැම්බර් 10 වන දිනය.

18. ශ්‍රී ලංකාවේ මුල්වරට ඇති කළ මහනගර සභා දෙක දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1). කොළඹ හා ගාල්ල (2). කොළඹ හා මාතර

(3). කොළඹ හා මහනුවර (4). මහනුවර හා ගාල්ල

19. විධායක කාරක සභා ක්‍රමය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද ?

(1). කෝල්බෲක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(2). මැනිං ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(3). මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(4). ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

20. මධ්‍යම ආණ්ඩුවේ හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරනු ලබන්නේ,

(1). මහ ඇමතිවරයා විසිනි. (2). අමාත්‍ය මණ්ඩලය විසිනි.

(3). ආණ්ඩුකාරවරයා විසිනි. (4). ජනාධිපතිවරයා විසිනි.

21. පළාත් සභාවක නිල කාලය වන්නේ,

(1). වසර 4 කි. (2). වසර 5 කි. (3). වසර 6 කි. (4). වසර 7 කි.

22. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් සභාවක සිටිය යුතු මන්ත්‍රීවරුන් ගණන තීරණය කරනුයේ,

(1). පළාතේ ජනගහනය පමණක් සැළකිල්ලට ගනිමිනි.

(2). පළාතේ වර්ග ප්‍රමාණය හා ජනගහනය සැළකිල්ලට ගනිමිනි.

(3). පළාතේ වර්ග ප්‍රමාණය පමණක් සැළකිල්ලට ගනිමිනි.

(4). රටේ සමස්ත ජනගහනය සැළකිල්ලට ගනිමිනි.

23. A විදේශ කටයුතු B ආගමන හා විගමන කටයුතු

C ජනලේඛන හා සංඛ්‍යා ලේඛන D ජාතික නිවාස හා ඉදිකිරීම්

ඉහත ප්‍රකාශ අතුරින් මධ්‍යම ආණ්ඩුව සතු බලතල පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1). A, B, C (2). A, C, D (3). B, C, D (4). A, B, D

24. පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන ආයතනය වන්නේ,

(1). ප්‍රාදේශීය සභාව (2). පළාත් සභාව (3). සභාව (4). මහ සභාව

25. ඇමරිකා එක්සත් ජනපද ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය හිමි වන්නේ,

(1). නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ය. (2). සන්ධීය අධිකරණයට ය.

(3). මහාධිකරණයට ය. (4). ශ්‍රේෂ්ඨාධිකරණයට ය.

26. ස්විස්ටර්ලන්තයේ ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලබන්නේ,

(1). සෙනෙට් සභාව නමිනි. (2). කොංග්‍රස් මණ්ඩලය නමිනි.

(3). සන්ධීය මහා මණ්ඩලය නමිනි. (4). මහා මණ්ඩලය නමිනි.

27. ඉතා සංකීර්ණ බහු සංස්කෘතියක් පවතින රටකි.

(1). ඉන්දියාව (2). ශ්‍රී ලංකාව (3). චීනය (4). ජපානය

28. A විජය ඇතුළු පිරිසගේ පැමිණීම B සේන ගුත්තිකගේ පැමිණීම

C කාලිංග මාඝගේ පැමිණීම. D සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිසගේ පැමිණීම

ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ සංක්‍රමණ පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද ?

(1). A හා B (2). A හා C (3). B හා C (4). A හා D

29. ආර්ථික බෝග වගා කිරීම සඳහා ශ්‍රමිකයින් ලෙස දකුණු ඉන්දීය ද්‍රවිඩ ජාතිකයන් ශ්‍රී ලංකාවට ගෙන එන ලද්දේ,

(1). පෘතුගීසීන් ය. (2). ලන්දේසීන් ය. (3). බ්‍රිතාන්‍යයන් ය. (4). ප්‍රංශවරුන් ය.

30. ''වෙනස්කම් තුළින් එකමුතු බව'' යන්න තේමාව කරගනිමින් බහු සංස්කෘතිකභාවය ප්‍රයෝජනයට ගත් රටවල් වන්නේ,

(1). සිංගප්පූරුව හා ස්විස්ටර්ලන්තය (2). ප්‍රංශය හා බ්‍රිතාන්‍යය

(3). සිංගප්පූරුව හා බ්‍රිතාන්‍යය (4). ස්විස්ටර්ලන්තය හා ප්‍රංශය

31. ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන නිර්ණායක වන්නේ,

(1). භූමිය හා ජන සංයුතිය යි (2). භූමිය හා ජන ඝනත්වය යි

(3). භූමිය හා ජනගහනය යි (4). ජනගහනය හා ජන සංයුතිය යි

32. මිනිසකු ලෙස ගරුත්වයකින් යුතුව සමාජයේ ජීවත් වීම සඳහා උපතින්ම ලැබෙන හිමිකම්,

(1). මානව අයිතිවාසිකම් ය. (2). යුතුකම් හා වගකීම් ය.

(3). මූලික අයිතිවාසිකම් ය. (4). අයිතිවාසිකම් ය.

33. ජාතික රාජ්‍ය සංකල්පය ශක්තිමත් කිරීමට දායක වූ දේශපාලන චින්තකයෙකු වන්නේ,

(1). චාර්ල්ස් ඒ. එල්වුඩ් ය. (2). ටී.බී. ටයිලර් ය.

(3). මහාචාර්ය වියරේ ය. (4). ජීන් බොඩැන් ය.

34. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විධායකය ලෙස සැලකෙන්නේ,

(1). අගමැති ය. (2). අමාත්‍ය මණ්ඩලය ය.

(3). අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ය. (4). ජනාධිපති හා අගමැතිවරයා ය.

35. A නීතිය හා සාමය ආරක්ෂා කිරීම B සමාජ සිරිත් විරිත් පිළිපැදීම.
C සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම D රජයට නියමිත බදු ගෙවීම.

මේ අතුරින් රාජ්‍යයට පැවරී ඇති වගකීම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1). A හා B (2). A හා C (3). B හා D (4). A හා D

36. පුද්ගලයින්ගේ බාහිර චර්යා පාලනය කිරීම සඳහා රාජ්‍යය මගින් පනවනු ලබන රීති හඳුන්වන්නේ,

(1). නීති නමිනි. (2). සිරිත් විරිත් නමිනි.

(3). සම්ප්‍රදායයන් නමිනි. (4). අයිතිවාසිකම් නමිනි.

37. ස්විස්ටර්ලන්තයේ ප්‍රාන්ත හඳුන්වන්නේ,

(1). ප්‍රාන්ත ලෙසිනි. (2). සභාව ලෙසිනි.

(3). කැන්ටන් ලෙසිනි. (4). ප්‍රාදේශීය ඒකක ලෙසිනි.

38. බලය බෙදා හරින ලද රාජ්‍ය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1). ඇමරිකා එක්සත් ජනපදය (2). එක්සත් ජනපදය

(3). ප්‍රංශය (4). ශ්‍රී ලංකාව

39. යහපාලනයක මූලිකාංගයක් වන්නේ,

(1). මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.

(2). දූෂණයෙන් හා වංචාවෙන් යුතු රාජ්‍ය පාලනය

(3). සම්පත් අකාර්යක්ෂමව භාවිත කිරීම.

(4). අධිකරණයේ ස්වාධීනත්වය සුරැකීම.

40. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇති කිරීමට පදනම් වූ ව්‍යවස්ථා සංශෝධනය මින් කුමක්ද?

(1). 10 වන ව්‍යවස්ථා සංශෝධනය (2). 11 වන ව්‍යවස්ථා සංශෝධනය

(3). 12 වන ව්‍යවස්ථා සංශෝධනය (4). 13 වන ව්‍යවස්ථා සංශෝධනය

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i). ද්වි පක්ෂ ක්‍රමය පවතින රාජ්‍යයන් දෙකක් නම් කරන්න.

(ii). ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් දක්වන්න.

(iii). නියෝජිතයන් පත් කර ගැනීම සඳහා වර්තමානයේ බහුලව භාවිතා කරන ක්‍රම දෙක සඳහන් කරන්න.

(iv). නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ දෙකක් ලියන්න.

(v). ජාතික රාජ්‍යයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(vi). රටක නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණ දෙකක් ලියන්න.

(vii). සන්ධීය ආණ්ඩු ක්‍රමයක අයහපත් ලක්ෂණ දෙකක් ලියන්න.

(viii). පළාත් පාලන ආයතනවල මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යයන් දෙකක් දක්වන්න.

(ix). 1871 දී ගම් සභා ක්‍රමය නැවත ස්ථාපිත කිරීමේදී ඊට පැවරූ කාර්යන් දෙකක් දක්වන්න.

(x). සදාචාරාත්මක යුතුකම් දෙකක් ලියා දක්වන්න.

(ල.2 x 10 = 20)

02. වර්තමානයේ බොහෝ රටවල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තම රටවල පාලනය සඳහා යොදා ගෙන ඇත.

(i). ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මගින් ඉටු කළ යුතු කාර්යභාරයන් දෙකක් දක්වන්න. (ල.2)

(ii). තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් දක්වන්න. (ල.3)

(iii). ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

03. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය පාලන ආයතන අතර බලය බෙදා ඇති ආකාරය සැලකිල්ලට ගෙන රාජ්‍යයන් වර්ග කර ඇත.

(i). රාජ්‍යයේ ස්වරූප දෙක නම් කරන්න. (ල.2)

(ii). ව්‍යවස්ථාදායකයට පැවරී ඇති කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ල.3)

(iii). a). රාජ්‍යයට පැවරී ඇති කාර්යයන් දෙකක් දක්වන්න. (ල.2)

b). පුරවැසියා සතු නීතිමය යුතුකම් දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.3)

04. ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ජන සමාජය තුළ ස්ථාපිත වීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ සාර්ථකත්වයට හේතු වේ.

(i). ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක වෙසෙන පුරවැසියකු සතු විය යුතු ගුණාංග දෙකක් දක්වන්න. (ල.2)

(ii). පුරවැසියන්ගේ ජීවන තත්වයේ ගුණාත්මකභාවය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සමාජ සුබසාධක වැඩසටහන් තුනක් දක්වන්න. (ල.3)

(iii). ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

05. යහපාලනය රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.

(i). යහපාලනයක මූලික ගුණාංග දෙකක් දක්වන්න. (ල.2)

(ii). සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන සාධක තුනක් ලියා දක්වන්න. (ල.3)

(iii). a). බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි දෙකක් දක්වන්න. (ල.2)

b). බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.3)

06. රාජ්‍ය පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා එම රාජ්‍යයට ඇති හැකියාව බලය ලෙස අර්ථ දැක්විය හැකිය.

(i). බලයේ ස්වරූප දෙකක් දක්වන්න. (ල.2)

(ii). සන්ධීය ආණ්ඩු ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් දක්වන්න. (ල.3)

(iii). a). ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ දෙකක් දක්වන්න. (ල.2)

b). ඒකීය ආණ්ඩු ක්‍රමයක් පැවතීමේ වාසි දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.3)

07. රාජ්‍යයේ බල අධිකාරිය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත අතර බෙදී තිබීම සන්ධිය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණයක් වේ.

(i). ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාට සෙනෙට් සභාවේ අනුමැතිය ඇතිව ක්‍රියාවට නැංවිය යුතු බලතල දෙකක් නම් කරන්න. (ල.2)

(ii). ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත රාජ්‍යවලට හිමි බලතල තුනක් දක්වන්න. (ල.3)

(iii). ස්විස්ටර්ලන්තයේ සන්ධීය රාජ්‍යයක් බිහිකර ගැනීමට බලපෑ හේතු දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)